සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

Learning Resource Centre
De Mazenod College
Kandana
63118

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 1 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name .................................................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................................

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසැඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතුරින් අරාබි සාහිත්‍ය මූලාශ්‍රයක් වන්නේ මින් කුමක්ද?
    1. රිබෙයිරෝ ගේ ලංකා ඉතිහාසය
    2. බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය
    3. එදා හෙළදිව
    4. ඉබන් බතුතාගේ දේශාටන වාර්තාව

02. මයුර සන්දේශය හා තිසර සන්දේශය රචනා වූ යුගය ලෙස සැලකෙන්නේ
    1. දඹදෙණිය ය.
    2. යාපහුව ය.
    3. ගම්පොළ ය.
    4. කෝට්ටේ ය.

03. මිනිහාගල්කන්ද, බූන්දල, අලුගල්ගේ යන ප්‍රාග් ඓතිහාසික ස්ථාන පිහිටි පරිසර කලාපය මින් කුමක්ද?
    1. අර්ධ ශුෂ්ක කලාපය.
    2. පහතරට වියළි කලාපය.
    3. පහතරට තෙත් කලාපය.
    4. කඳුකර වියළි කලාපය.

04. මීට වසර තිස් අට දහසකට පෙර ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයින් පිළිබඳ තොරතුරු හමුවූ ස්ථානයක් වන්නේ
    1. අලිගල ය.
    2. පාහියන්ගල ය.
    3. බෙල්ලන් බැඳි පැලැස්ස ය.
    4. කුරුවිට බටදොඹලෙන ය.

- ගමිකයින් අන් අයට පවා උදව් කළ හැකි තරමට ධනවත් වූ පිරිසක් බව
- ගමිකයින් ගෘහපතීන් අතුරින්ම පත්වූ කෙනෙකු බව

05. ගමිකයින් පිළිබඳ ඉහත සඳහන් තොරතුරු ලියැවී ඇති කෘතීන් දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
    1. රසවාහිනිය, සමන්තපාසාදිකාව
    2. ජාතකට්ඨකතාව, රසවාහිනිය
    3. ජාතකට්ඨකථාව, සමන්තපාසාදිකාව
    4. සමන්තපාසාදිකාව, ජාතකට්ඨකථාව

පහත අ සහ ආ තීරු නිවැරදි ව ගලපා පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. නාගරික වාස්තු විද්‍යාඥ | A - රූප අදෙක |
| 2. භෝජන ශාලා අධිකාරී | B - කනපෙඩික |
| 3. කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානී | C - නගරගුතික |
| 4. රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී | D - නගරවුඩික |
| | E - බතගු |

1. DECB
2. CBAE
3. CEAB
4. DEAB

07. කාලිංග චක්‍රවර්තී ස්වාමීන් වහන්සේ නමින් සෙල්ලිපිවල තමාව හඳුන්වා ඇති රජතුමා වන්නේ,
1. කුටකණ්ණ අභය 2. මහසෙන් 3. පළමුවන කාශ්‍යප 4. නිශ්ශංකමල්ල

08. "රතුකැට දිවයින" නමින් ශ්‍රී ලංකාව හඳුන්වා ඇත්තේ කුමන ජාතිකයින් විසින් ද?
1. රෝම 2. අරාබි 3. ග්‍රීක 4. පෘතුගීසි

09. නීතිය පිළිබඳ හසල දැනුමක් තිබූ වෘත්තිකයින් හැඳින්වීමට පැරණි ලේඛනවල යෙදී ඇති වචනයක් වන්නේ
1. වාපර 2. වෙජ 3. වොහාර 4. චිතකර

10. පහත සඳහන් වැව් අතුරින් මහසෙන් රජතුමා විසින් තනවන ලද වැවක් නොවන්නේ කුමක් ද?
1. මින්නේරිය වැව 2. කවුඩුල්ල වැව 3. හුරුළු වැව 4. පදවිය වැව

11. පීඩනය පිළිබඳ දැනුම තාක්ෂණය සඳහා භාවිත කළ අවස්ථාවකට හොඳම උදාහරණයක් වන්නේ
1. බලංගොඩ සමනල වැව යකඩ නිස්සාරණ උදුන් ය.
2. රුවන්වැලිසෑයේ අත්තිවාරම ය.
3. ඌරා කැට ළිං තැනීම ය.
4. සීගිරියේ ජලමල් ය

12. 'මතරමජිබක' නැමති බදු වර්ගය අය කරනු ලැබුවේ මින් කුමන කාර්යයක් සඳහා ද?
1. ඇළ මාර්ගවල මසුන් ඇල්ලීම. 2. හේන් වගා කිරීම.
3. වැව්වල ජලය භාවිත කිරීම. 4. රජුට අයත් ඉඩම්වල වගා කිරීම.

13. ඓතිහාසික යුගයේ සමාජ සංවිධානය අනුව ප්‍රභුවරුන්ගේ මට්ටමට පහළින් සිටියේ
1. සාමාන්‍ය ජනතාව ය. 2. දාසයින් ය.
3. සාමාන්‍ය ශිල්පීන් ය. 4. සංඝයා වහන්සේලා ය.

14. පහත A, B, C, D යන ප්‍රකාශ අතුරින් තුන්වන විජයබාහු රජතුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුලත් පිළිතුර තෝරන්න.
A කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබීම.
B දඹදෙණිය සිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම.
C බෙලිගල දළදා මැදුරක් කරවීම.
D දේව පතිරාජ ඇමතිවරයා යොදවා ආර්ථිකය දියුණු කරවීම.
1. A හා B ය. 2. B හා C ය. 3. A හා C ය. 4. C හා D ය.

15. මාතෘ මූලික උරුම ක්‍රමය අනුව රජකම උරුම වූ අවස්ථාවක් ගැන තොරතුරු සඳහන් වන්නේ මින් කුමන රාජධානි සමයේදී ද?
1. අනුරාධපුර 2. දඹදෙණි 3. කුරුණෑගල 4. ගම්පොළ

16. දොන් ජුවාන් නමින් බෞතීස්ම ලැබූ කුමාරයා වූයේ
1. වීරසුන්දර බණ්ඩාර ය. 2. කොනප්පු බණ්ඩාර ය.
3. යමසිංහ බණ්ඩාර ය. 4. ධර්මපාල ය.

පහත වගුවේ A සිට J දක්වා සඳහන් තොරතුරු ඇසුරෙන් 17 සහ 18 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ස්ථානය | හමුදා ප්‍රධානියා | රජතුමා |
|---|---|---|
| A - ගන්නොරුව<br>B - මුල්ලේරියාව<br>C - බලන | D - අපොන්සු පෙරෙයි රා ද ලසර්දා<br>E - දියෝගුද මේලෝ කැස්ත්‍රෝ<br>F - දොන් ජෙරනිමෝද අසවේදු | G - මායා දුන්නේ<br>H - පළමුවන විමලධර්මසූරිය<br>J - දෙවන රාජසිංහ |

17. ගන්නොරුව සටනට සම්බන්ධ වූ පෘතුගීසි හමුදා ප්‍රධානියා සහ උඩරට රජතුමා දක්වෙන පිළිතුර කුමක් ද?
1. D හා J ය. 2. F හා G ය. 3. E හා H ය. 4. E හා J ය.

18. ආසියානු රටකදී පෘතුගීසීන් ලැබූ දරුණුතම පරාජය සටහන් වන සටන සිදු වූ ස්ථානය හා පෘතුගීසි සෙන්පතියා ඇතුළත් පිළිතුර තෝරන්න.
1. B හා F ය. 2. B හා D ය. 3. C හා D ය. 4. A හා E ය.

19. උඩරට රාජධානියේ රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම් හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
1. ගබඩාගම 2. පරවේණිගම් 3. නින්දගම් 4. දේවාලගම්

20. දේශ ගවේෂණය සඳහා මුලින්ම උනන්දු වූ රටවල් දෙක දක්වෙන පිළිතුර තෝරන්න.
1. පෘතුගාලය හා බ්‍රිතාන්‍ය 2. ඉතාලිය හා ප්‍රංශය
3. පෘතුගාලය හා ස්පාඤ්ඤය 4. ග්‍රීසිය හා ස්පාඤ්ඤය

21. ඉන්දියාවට පැමිණි වස්කෝද ගාමා ගොඩබසින ලද වරාය කුමක්ද?
1. ගෝව 2. කැලිකට් 3. බොම්බාය 4. මදුරාසිය

22. උඩරට රාජධානිය යටත් කර ගැනීමට සීතාවක රාජසිංහ රජුට උදව්කළ ප්‍රභුවරයා වූයේ
1. වීරසුන්දර බණ්ඩාර ය. 2. යමසිංහ බණ්ඩාර ය.
3. කොනප්පු බණ්ඩාර ය. 4. වීදියෙ බණ්ඩාර ය.

23. පහත A සිට D දක්වා සඳහන් යන්ත්‍ර සූත්‍ර අතුරෙන් කාර්මික විප්ලව සමයේ පේෂ කර්මාන්තයේ දියුණුවට හේතු වූ යන්ත්‍ර සූත්‍ර පමණක් දක්වෙන පිළිතුර තෝරන්න.
A - රෝලර් යන්ත්‍රය B - ජෙනී යන්ත්‍රය
C - මියුල් යන්ත්‍රය D - විදුලි උදුන
1. A හා B ය. 2. B හා C ය. 3. A හා C ය. 4. C හා D ය.

24. ජෙන් රෝටල් විසින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා සොයා ගන්නා ලද ක්‍රමයක් වූයේ
1. බැටලු වර්ග අභිජනනය යි. 2. පේළියට වැපිරීමේ ක්‍රමය යි.
3. ශෂ්‍ය මාරු ක්‍රමය යි. 4. රසායනික පොහොර යෙදීම යි.

25. ක්‍රි ව 1797 දී මුහුදුබඩ ප්‍රදේශවල ඇතිවූ කැරැල්ල සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද බදු වර්ගය කුමක්ද?
1. දුම්කොළ බද්ද 2. මාළු බද්ද 3. පොල්ගස් බද්ද 4. ලුණු බද්ද

- පහත සඳහන් ප්‍රකාශ අධ්‍යයනය කර 26 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න
A - සෙන්පති මැක්ඩෝවල්ගේ නායකත්වයෙන් උඩරටට දූත පිරිසක් යැවීම.
B - ජෝන් ඩොයිලි නම් කාර්යශූර සිවිල් නිලධාරියා පත්කර ගැනීම.
C - උඩරට ගිවිසුමට අත්සන් තැබීම.
D - මුත්තුසාමි කුමරු උඩරට රජුලෙස ප්‍රකාශයට පත් කිරීම.

26. පෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා සම්බන්ධයෙන්
1. A හා B ප්‍රකාශ නිවැරදි වේ. 2. B හා C ප්‍රකාශ නිවැරදි වේ.
3. C හා D ප්‍රකාශ නිවැරදි වේ. 4. A හා D ප්‍රකාශ නිවැරදි වේ.

27. පහත A සිට D දක්වා දී ඇති නායකයින් අතුරෙන් 1848 නිදහස් සටනේ නායකයින් දක්වෙන පිළිතුර කුමක්ද?
A - බූටෑවේ රටේ රාළ B - මඩුගල්ලේ දිසාව
C - පුරන් අප්පු D - ගොන්ගාලේගොඩ බණ්ඩා
1. A හා B ය. 2. B හා C ය. 3. C හා D ය. 4. B හා D ය.

28. "උදයභානු" නමින් පුවත්පතක් ආරම්භ කිරීමට පුරෝගාමී වූයේ කවුරුන් ද?
1. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා 2. අරුමුග නාවලර් තුමා
3. පොන්නම්බලම් රාමනාදන් මහතා 4. සිද්දිලෙබ්බේ මහතා

29. වයස අවුරුදු 21 ට වැඩි ස්ත්‍රී පුරුෂ සියලුම පුරවැසියන්ට ඡන්ද බලය ලබාදීමට යෝජනා වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?
1. කෝල්බෲක් 2. මැනිං 3. ඩොනමෝර් 4. සෝල්බරි

30. කොකෝවා වඩා හොඳින් වගා කළ හැකි දිස්ත්‍රික්කය බවට පත්වූයේ
1. මාතලේ ය. 2. බදුල්ල ය. 3. නුවරඑළිය ය. 4. මහනුවර ය.

31. රබර් පර්යේෂණායතනය පිහිටි ප්‍රදේශය වන්නේ
1. ලුණුවිල ය. 2. ගම්පහ ය. 3. මාතලේ ය. 4. අගලවත්ත ය.

32. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවීමේ පුරෝගාමියා ලෙස සැලකෙන්නේ
1. එස් ඩබ් ආර් ඩී බණ්ඩාරනායක මහතා ය. 2. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ය.
3. ඩී එස් සේනානායක මහතා ය. 4. ජෝන් කොතලාවල මහතා ය.

33. පහත සඳහන් බලතල අතුරින් පාර්ලිමේන්තුව සතු බලතලයක් නොවන පිළිතුර තෝරන්න
1. නීති පැනවීම. 2. අයවැය සකස් කිරීම.
3. සංවර්ධන සැලසුම් සම්පාදනය. 4. රාජ්‍ය මුද්‍රාව භාරයේ තබා ගැනීම.

34. ස්වීඩන් රජයේ ආධාර ලබාගෙන මෙරට ඉදිකළ ජලාශය කුමක් ද?
1. කොත්මලේ 2. වික්ටෝරියා 3. රන්දෙණිගල 4. රන්ටැඹේ

35. බ්‍රිතාන්‍යයන් විසින් ඇමරිකාවේ පිහිටුවා ගත් ජනපද අතුරින් මුල්ම හා අවසන් ජනපදය පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න
1. වර්ජිනියා, පෙන්සිල්වේනියා 2. වර්ජිනියා, ජෝර්ජියා
3. නිව්යෝර්ක්, දකුණු කැරොලිනා 4. ජෝර්ජියා, උතුරු කැරොලිනා

36. 'සමාජ සම්මුතිය' නම් සිය ග්‍රන්ථය මගින් ජනතා ස්වාධිපත්‍යය පිළිබඳ සංකල්පය ඉදිරිපත්කළ දාර්ශනිකයා කවුරුන් ද?
1. රූසෝ 2. මොන්ටෙස්ක්‍යු 3. වී අයි ලෙනින් 4. වොල්ටෙයාර්

පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර 37 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. මාර්ෂල් සැලැස්ම
2. මාර්ෂල් ටිටෝ

B - 1. ඔටෝවොන් බිස්මාර්ක්
2. ජර්මනිය බිහිකිරීම

C - 1. ප්‍රංශ හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය
2. දෙවන ලෝක මහා සංග්‍රාමය

D - 1. නාසිවාදය
2. හිට්ලර්

37. පළමුවැන්නේ ක්‍රියාකලාපය මත දෙවැන්න සිදු වූ පද යුගලය කුමක්ද?
1. A 2. B 3. C 4. D

38. පළමුවැන්නෙහි වර්ධනයත් සමග දෙවැන්නේ බලවත් වීම දක්වෙන පද යුගලය කුමක් ද?
1. A 2. B 3. C 4. D

39. දෙවැන්නේ බලපෑම මත පළමුවැන්න බිඳ වැටීම දක්වෙන පද යුගලය කුමක්ද?
1. A 2. B 3. C 4. D

40. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් නොදක්වෙන පද යුගලය කුමක් ද?
1. A 2. B 3. C 4. D

(ලකුණු 2X40 = 80)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

29.02.2024

Learning Resource Centre R
De Mazenod College
Kandana
6310

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 3 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

උපදෙස්

- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකටද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I - කොටස

01. (අ) i. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.
ත්‍රිකුණාමලය වරාය, මාතලේ, බදුල්ල, මීනිපේ අමුණ, නාච්චදූව වැව, පදවිය වැව, පුත්තලම, මැණික් ගඟ, කලාඔය. රංචාමඩම, අලිමංකඩ, පල්ලවවංක (ලකුණු 12 යි)


ii. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.
මදුරාසිය (චෙන්නායි), පර්සියන් බොක්ක, මලය අර්ධද්වීපය, රෝමය, ජාවා දූපත, කාම්බෝජය (ලකුණු 06 යි)

(ආ) i. පහත A,B,C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - සෙල්ලිපියක 'අලකපය මහරජ' යනුවෙන් හඳුන්වා ඇති රජතුමා කවුරුන් ද?
B - එදා හෙළදිව නමින් හැඳින්වෙන විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය රචනා කරන ලද කතුවරයාගේ නම කුමක් ද?
C - වැවේ ජලය පිටතට ගැනීමේදී එහි පීඩනය පාලනය කිරීමට තැනූ අංගය හඳුන්වන්නේ කුමන නමින්ද?
D - ක්වීනින් නැමති ඖෂධය නිපදවීමට යොදාගත් බෙහෙත් පැළෑටිය කුමක් ද? (ලකුණු 04 යි)


- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න

ii. 1. A රූපයෙන් දක්වෙන්නේ කුමක් ද?
2. මෙය දක්නට ලැබෙන ඓතිහාසික නගරය නම් කරන්න.
3. මෙය කරවන ලදැයි සැලකෙන රජතුමා කවුරුන් ද?
4. මෙය කුමන මූලාශ්‍ර වර්ගයට අයත් ද?



A (ලකුණු 04 යි)

iii. 1. B රූපයෙන් නිරූපණය වන්නේ කුමක් ද?
2. මෙය භාවිත කළේ කුමන කටයුත්තක් සඳහා ද?
3. මේ කාර්යය සඳහා අණදුන් නායකයා කවුරුන් ද?
4. ඔහු පිහිටුවා ගනු ලැබූ දේශපාලන පක්ෂය හැඳින්වූයේ කුමන නමින්ද?



B (ලකුණු 04 යි)

## II - කොටස

02. i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහත රට තෙත් කලාපීය ලෙන් පිහිටි ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03යි)

ii. පහත සඳහන් ඓතිහාසික තොරතුරු හමු වූ ස්ථාන වරහන තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.
(කුරුවිට බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන, රංචාමඩම, රාවණාඇල්ල ලෙන)
A - මිනිස් හිස් කබලක දෙකට බෙදෙන ලෙස සිදුරු විද තිබීම.
B - මළවුන් නමා වකුටුකර වළ දැමීමේ අභිචාර විධි පැවති බව.
C - කැළෑදෙල් ඇට පුළුස්සා ආහාරයට ගත් බව.
D - මිනිස් ඇටසැකිලි ආදාහනය කිරීමට මැටිඹරු සුසාන භාවිත කළ බව. (ලකුණු 04 යි)

iii. පූර්ව ඓතිහාසික යුගයේ මැටි බඳුන් තැනීමේ තාක්ෂණය ඉතා දියුණු මට්ටමක පැවති බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. පැරණි සමාජයේ කෘෂිකර්මාන්තය සකස් වී පැවති ආකාරය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න.(ලකුණු 06 යි)

03. i. රජවරුන්ට ආරෝපණය වූ රාජ්‍යත්ව සංකල්ප තුනක් ලියන්න. (ලකුණු 03යි)

ii. අතීත පාලකයින් විසින් තම රටවැසියාට ඉටුකළ යුතු යැයි සැලකූ යුතුකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

iii. මෙරට දේශපාලන බලය වර්ධනය වීමේදී ගමික සහ පරුමකවරු ඉටුකළ කාර්යයන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. වසභ රජතුමා මෙරට ශ්‍රේෂ්ඨතම පාලකයෙකු ලෙස සැලකීමට හේතු වූ කරුණු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

04. i. බෞද්ධ විහාරවල විසූ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදිකළ පුරාණ පොකුණු තුනක නම් සඳහන් කරන්න. (ලකුණු 03යි)

ii. පහත සඳහන් වැව් ඉදිකරන ලදැයි සැලකෙන රජවරුන්ගේ නම් A, B, C, D අනුපිළිවෙළින් ලියන්න.
A - මින්නේරි වැව
B - කලා වැව
C - පදවිය වැව
D - ගිරිතලේ වැව (ලකුණු 04 යි)

iii. පුරාණ යකඩ නිස්සාරණ තාක්ෂණය ඉතා දියුණු මට්ටමක පැවති බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. නිරෝගිමත් දිවි පැවැත්ම සඳහා පැරණි ශ්‍රී ලාංකිකයින්ගේ ආහාර රටාවෙන් ගත හැකි ආදර්ශ උදාහරණ තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි)

05. i. දෙවන නාගරීකරණ අවධියට පෙර පැවති ශ්‍රී ලංකාවේ රාජධානි තුනක් නම් කරන්න. (ලකුණු 03යි)

ii. පොළොන්නරු රාජධානිය පරිහානියට පත්වීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 04 යි)

iii. දෙවන නාගරීකරණ අවධියේදී ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ දක්නට ලැබුණු වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. කෝට්ටේ රාජධානියේ හයවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලන හා සාහිත්‍ය සේවාව කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

06. i. පහත A,B,C යටතේ සඳහන් තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.
A - පෘතුගීසීන්ට එරෙහි සටන්වලදී මායාදුන්නේ රජුට නාවික සහාය ලබාදුන් කැලිකට්හි පාලකයා
B - පස්යොදුන් කෝරළයේ පැළෑඳ නම් ප්‍රදේශයේ බලකොටුවක් තනා පෘතුගීසි විරෝධී සටන් ආරම්භ කළ කුමාරයා
C - ක්‍රි. ව. 1619 දී පෘතුගීසීන් යාපනය යටත් කර ගැනීමේදී පෘතුගීසි හමුදාව මෙහෙය වූ සෙන්පතියා (ලකුණු 03යි)

ii. ක්‍රි. ව. 1638 උඩරට ලන්දේසි ගිවිසුමේ සඳහන් මූලික කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04 යි)

iii. ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමුවීමට බල පෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. ඉංග්‍රීසීන්ට උඩරට රාජධානිය යටත් කර ගැනීමට තුඩුදුන් හේතු තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

07. i. පහත සඳහන් එක් එක් දේශපාලන වෙනස්කම් සිදුවූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ දැයි A, B, C අනුපිළිවෙළින් ලියන්න.

A - ආණ්ඩුකාර තනතුර වෙනුවට අග්‍රාණ්ඩුකාර තනතුර ස්ථාපනය කිරීම.

B - සාමාජිකයින් 61 දෙනෙකුගෙන් සමන්විත රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම.

C - ව්‍යවස්ථාදායක සභාව වෙනුවට ජාතික රාජ්‍ය සභාව ස්ථාපිත කිරීම (ලකුණු 03 යි)

ii. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් සිදුකල ආර්ථික වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

iii. බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරටට උරුමවූ හිතකර හා අහිතකර බලපෑම් එක බැගින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ රජයන් විසින් සමාජ ශුභ සාධනය උදෙසා ගත් ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

## III කොටස

08. i. පුනරුද සමයේ නැගී ආ චින්තන ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් ලෙස කතෝලික සභාවේ දුර්වලතා විවේචනය කළ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03 යි)

ii. යුරෝපයේ පුනරුදය ඇතිවීමට බල පෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04 යි)

iii. පුනරුද සමයේ විද්‍යාත්මක දියුණුව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. යුරෝපා පුනරුදය මෙරට ආර්ථික හා සමාජ සංස්කෘතික වෙනස්කම් කෙරෙහි බල පෑ ආකාරය උදාහරණ තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

09. i. යටත් විජිත පිහිටුවාගත් යුරෝපා රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

ii. පහත සඳහන් තොරතුරු වලට අදාළ වන පිළිතුර වරහන තුළින් තෝරා A, B, C, D අනුපිළිවෙළින් ලියන්න. (ඔස්ට්‍රියාව, බොස්නියාව, ප්‍රංශය, ජර්මනිය, පර්ල්, එස්. එස්, කළුකමිස)

A - ඇල්සාස්, ලොරේන්ස්, නැමැති සාරවත් ප්‍රදේශ පැහැරගත් රට

B - ප්‍රාන්ස් පර්ඩිනාන්ඩ් කුමරු හා ඔහුගේ බිසව ඝාතනයට ලක් වූ රට

C - හිට්ලර්ගේ හමුදාව හැඳින් වූ නම

D - ජපානය විසින් බෝම්බ හෙළා විනාශ කළ වරාය (ලකුණු 04 යි)

iii. එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය රැකීම සඳහා ගත් ප්‍රයත්න දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

iv. දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)